


# නැගෙනහිර වෙරළේ පාරාදීසය - පරවි දූපත

ටී. එම්. අනුරුද්ධ තෙන්නකෝන්



සංචාරක ව්‍යාපාරය සඳහා සාර්ථකව යොදාගත හැකි අසීමිත විභවයන් නිසාම ශ්‍රී ලංකාව සංචාරක පාරාදීසයක් ලෙස ලොව පුරා ප්‍රචලිතව ඇත. ආගමික වටපිටාව, සංස්කෘතිය කලාව මෙන්ම පාරිසරික සුන්දරත්වයද මෙම පාරාදීසය නිර්මාණ කිරීමට හේතුවූ බව පැහැදිලිය.

අප රට සතු චමත්කාරජනක වෙරළ තීරය සංචාරකයන් මෙරටට කැන්දන ප්‍රබලතම සාධකයකි. විජය කුමරුගේ ආගමනයත් සමගම ඇරඹෙන අපේ වෙරළ වර්ණනාව අද වන විට ලොව සොඳුරුතම වෙරළ තීරයක් ලෙස පිළිගන්නා තරමටම වර්ධනය වී ඇත.

ජගත් මට්ටමින් සංචාරක ව්‍යාපාරය සම්බන්ධව සැලකෙන මෙම වෙරළ තීරයන්ගෙන් අපේ නිලාවැලි වෙරළ තීරය සොබාදහමේ තවත් එක් අපූරු නිර්මාණයකි.

දශක දෙකක පමණ කාලයක්ම අවාසනාවන්ත සිදුවීම් සමුදායකින් මෙම වෙරළ තීරය සංචාරකයින්ගෙන් දුරස් කරන ලදී. ප්‍රීතිමත් මිනිස් කටහඬවල් වෙනුවට පරිසරය ගිගුම් දෙවන පිපිරුම් හඬවල්, එහි ලැගුම්ගෙන තිබිණි. එවැනි භීෂණ සමයකට පසුව නැවතත් මිනිස් පහස විඳීමට මෙම වෙරළට ඉඩ ලැබී තිබීම රටේ භාග්‍යයකි.

පිරිසිදු සුදු වැල්ලෙන් සෑදුනු පුලුල් වෙරළක් තද නිල් පැහැති සයුරක් නිසාම නිලාවැලි ප්‍රදේශය සංචාරකයන් අතර ඉතා ප්‍රසිද්ධය. එසේම සුන්දර නිලාවැලිය තවත් එක් කරුණක් නිසා ද සුවිශේෂී වන්නේය. ඒ, අසල පිහිටි පරෙවි දූපත (Pigeon Island) නිසාවෙනි.

පරෙවි දූපත කරා ගමන ත්‍රාසයත් භීතියත් කැටිකරගත් එකකි. බෝට්ටුවේ බඳෙහි වදින දැවැන්ත රළ ගෙඩි නිසාවෙන් අඩි ගනනක් ඉහලට විසිවෙන බෝට්ටුව නැවත ජල තලයට පතිත වන්නේ සියල්ලන්ම කරදියෙන් තෙත බරිත කරවමින්ය. හාත්පස දර්ශණය වන නිල් පැහැති සයුරු වෙරළ ආසන්නයේ ප්‍රචණ්ඩ වුවත් තරමක් වෙරළින් දුරස්වනවිට සාමාන්‍ය තත්ත්වයට පත්වේ. කෙසේ වුවත් සමබරතාව සුරැකෙන පරිදි වේගයෙන් ධාවනය වන බෝට්ටුව තුළ සිටීම නම් ඉතාම අසීරුය.

නිලාවැලි වෙරළට පෙනුනු කුඩා දූපත දැන් දැන් තරමක් සමීපව දැකගත හැක. ක්‍රමයෙන් දූපතට සමීපවත්ම කලින් පෙනුනු කඳු ගැටය සහිත දූපත එකක් නොව කුඩා දූපත් 2ක් බව පැහැදිලි වෙයි.

මිනිත්තු 20 ක පමණ ගමනකින් පසුව අපි පරවි දූපතට පැමිණ ඇත්තෙමු. මෝටර් බෝට්ටුවේ හඬ ක්‍රමයෙන් අඩුවත්ම තවත් නැවුම් අත්දැකීමක් විඳ ගැනීමට කවුරුත් සැරසුනේ කඩිසරවය.


පරෙවි දූපත සම්බන්ධව පැවසෙන කථාව ඉතාමත් විචිත්‍රවත්ය. මෙයට පරෙවි දූපත යන නම ලැබීමට හේතුව එහි සිටින පරෙවියන්ය. නමුත් විශේෂ කරුණක් වන්නේ මෙම පරෙවියන් අපට හුරුපුරුදු සාමාන්‍ය ගෘහාශ්‍රිත පක්ෂීන් නොවීමයි. (Blue Rock Pigeon) (ගල් පරෙවියන්) ලෙස හඳුන්වන මොවුන් ගෘහාශ්‍රිත පරෙවියන් සමග මිශ්‍ර නොවූ දුර්ලභ පක්ෂි විශේෂයකි. මෙම පක්ෂීන්ගේ අභිජනනයන් දූපතේ දී ම සිදුවන අතර දූපත පුරාම පාහේ සුලභව ඔවුන් දැක ගත හැක.

එසේම පරෙවි දූපතෙන් හැරුණුවිට මෙම සුවිශේෂීය පක්ෂි විශේෂය මෙරටදී දැකගත හැක්කේ නැගෙනහිර වෙරළේ පවතින තවත් කුඩා දූපත් 2කදී පමණක් බව පැවසේ.

අධිරාජ්‍යවාදී පාලන සමයේ පරෙවි දූපත ඔවුන්ගේ යුධ හමුදාවේ වෙඩි පිටියක් ලෙස යොදා ගෙන ඇත. වර්තමානයේදී මේ දූපත දෙස් විදෙස් සංචාරකයන් අතර ප්‍රචලිතව ඇත්තේ විනෝදාස්වාදය සඳහා යොදගතහැකි සොබදහමේ අපූරු නිර්මාණයක් ලෙසිනුයි.

නැගෙනහිර වෙරළේ උතුරු අක්ෂාංශ $8^{0}$ $43^{'}$ හා නැගෙනහිර දේශාංශ $81^{0}$ $12^{'}$ අතරේ පිහිටි මෙම දිවයින වර්ග ප්‍රමාණයෙන් හෙක්ටයාර් 4.6 ක් පමණ වේ. දළ වශයෙන් උතුරු - දකුණු දිශාවන් ඔස්සේ විහිදෙන මෙම දූපතේ උතුරු කෙලවරට වන්නට ගල් පර්වත සහිත කුඩා කඳුගැටයක් දැක ගත හැක. දූපතේ නැගෙනහිර ප්‍රදේශයේදී සාගරය දූපත තුලට පැමිණ නොගැඹුරු තටාකයක් ලෙස සැකසී ඇති අතර, බටහිර වෙරළ තීරය නිලාවැලි වෙරළට මුහුණලා තිබේ. දූපත වටා මුහුදු තීරයේ ආසන්නව කුඩා ගල් පර දැකිය හැකි අතර ඒ හැම එකක්ම පරෙවියන්ගේ උරුමයන් බවට පත්ව ඇත.





කාලයක් තිස්සේ දූපතට ගසාගෙන ආ කැඩුනු කොරල් කැබලි රාශියක් එකට එකතු වී ස්වභාවිකව තැනුනු කොරල් වැටියක් මෙම දූපතේ නැගෙනහිර ප්‍රදේශයේ දැකිය හැක. අසල මුහුදේ පවතින කොරල් පරය පිළිබඳව අවබෝධයක් ලබාගැනීමට එයම ප්‍රමාණවත්ය.

පරෙවි දූපත වර්ෂ 1937 අංක 03 දරන වන සත්ත්ව හා වෘක්ෂලතා ආරක්ෂක පනත යටතේ වනජීවි රක්ෂිතයක් ලෙස ප්‍රකාශයට පත්කර ඇති අතර වර්ෂ 1974.11.01 දින සිට අභයභූමියක් ලෙස ප්‍රකාශයට පත් කර තිබේ.

එදා මෙදා තුර දෙස් විදෙස් සංචාරකයන් අතර පරෙවි දූපත විනෝදාස්වාදය සඳහාම වැදගත් වූ නමුත් තවත් එක් අංශයකින් සලකන විට එය අප ලද මහඟු දායාදයක් බඳුය.

එනම් පරෙවි දූපත සතු ජෛව විවිධත්වයයි. දූපතෙහි සුලභ පරෙවි විශේෂයට අමතරව දූපත අවට සයුර තුළ පවතින සජීවී කොරල් පරය මීට හේතුවයි. මෙහි ජෛව විවිධත්වය ඉතා ඉහල අගයක් ගන්නා අතර, මීටරයක් පමණ ගැඹුරු දියෙහි පවා වෛවර්ණ සජීව කොරල් දැක ගත හැක.

පර්යේෂණ වාර්තාවලට අනුව පරෙවි දූපත ආසන්නයේ පවතින මෙම කොරල් පරයේ ප්‍රමාණය වර්ග කිලෝමීටර් 10,000 පමණ වේ. එසේම සූවිශේෂීය මට්ටමේ ජෛව විවිධත්වයකට උරුම කියන බව ද පැවසේ.

වර්ෂ 1998 දී පමණ සිදුවූ කොරල් විරංජනය වීම නම් සිද්ධියක් සමග අපරට අපට පැවති බොහෝ සජීව කොරල්පර විනාශ වීම ඇරඹුනි. සාගර ජලයේ උෂ්ණත්වය ඉහළයාම නිසා හට ගැනුනු මෙම අහිතකර ප්‍රතිවිපාකය මගින් මාලදිවයින, තායිලන්තය හා ඉන්දියාව වැනි අප රටට ආසන්නයේ පිහිටි රටවලද බොහොමයක් කොරල්පර විනාශ විය. නමුත් මෙම සංසිද්ධියේදීද ත්‍රිකුණාමලය අවට මුහුදේ විශේෂයෙන්ම පරෙවි දූපත අවට පිහිටි කොරල් පර විරංජනයට ගොදුරු නොවිනි. එම නිසා අදද අපට පරෙවි දූපත ආසන්නයේ සජීව කොරල්පර දැකගත හැක.

මෙම කොරල්පරය, කොරල්පර ආශ්‍රිත ජෛව විවිධත්වය අධ්‍යයනය සඳහා ස්වභාවික විද්‍යාගාරයක් බඳුය. මෙහි පවතින කොරල් විශේෂ අතර මුව අං හැඩැති කොරල් (*Acropora spp.*)මෙන්ම (*Pocillopora*) හා (*millepora spp.*)වැනි දැඩි කොරල් විශේෂත්, මුහුදු ඇනිමෝනියා (Sea animones) වැනි මෘදු කොරල් විශේෂත් දැකගත හැක. එසේම මෙම පරය ආශ්‍රිතව වෙසෙන සාමුද්‍රික පෘෂ්ඨවංශී හා අපෘෂ්ඨවංශී ජීවි විශේෂ රාශියක් ද වේ.

විද්‍යාගාරයේ වීදුරු බෝතල් තුළදී පමණක් දුටු තාරකා මාලුවන් (Star fish.), මුහුදු කැකිරියන් (Sea cucumber), මුහුදු බලලුන් (Brital star) මෙම කොරල් පරය ආශ්‍රිතව ඉතා සුලභව සජීවීව දැකගත හැක.



පරවි දූපත



විවිධ කවඩි විශේෂ, දැල්ලන් හා පොකිරිස්සන්ද මෙම පරයේ සුලභව වාසය කරන අතර, පරයේ සුන්දරත්වය වැඩිකරමින් ඔබ මොබ පිහිනන වර්ණවත් කුඩා මත්ස්‍යය විශේෂ සංඛ්‍යාවද අතිමහත්ය. මොවුන් අතරින් (Grouper, Butterfly fish, Clown fish, Parrot fish, Angel fish හා Morag eel හා ඉතාමත් සුලභ බව පැවසේ. එසේම ඉතා විශාල Butterfly fish සංඛ්‍යාවක් පරය ආශ්‍රිතව සිටීම නිසාම එය නිරෝගී තත්ත්වයේ සරු කොරල් පරයක් ලෙස හැඳින්විය හැක.

නමුත් මෙම සුන්දර පාරාදීසය සම්බන්ධවද වඩා අවධාරණයෙන් පැවසිය යුතු දුක්මුසු කරුණක් ඇත. එනම් පරවි දූපතද විනාශ වන කාලය එළඹ ඇති බවයි.

මේ වන විට දිනකට ඉතා විශාල සංචාරකයන් සංඛ්‍යාවක් දූපතට පැමිනෙන අතර, දිගු සති අන්තවලදී සහ ප්‍රසිද්ධ නිවාඩු දිනවලදී එය ඉතා ඉහළ අගයක් ගනී. මෙම අධික සංචාරක සංඛ්‍යාව පරෙවි දූපතේ ප්‍රමාණයට කිසිසේත් ඔරොත්තු නොදෙන අතර එමගින් සෙවන සඳහා මෙන්ම ගිමන් හැරීම, ආහාර ගැනීම සඳහා දූපතේ සීමිත තුරු සෙවන විනාශ කිරීමත් බහුලව සිදුවේ. අවිධිමත් ලෙස බැහැර කරන අපද්‍රව්‍ය නිසා පරෙවි දූපතම අපවිත්‍රවීමකට ලක්වී ඇති අතර, ප්ලාස්ටික් පොලිතින් ආදිය දැනටමත් පරිසරය ආක්‍රමණය කර ඇත.

සංචාරකයන් සතු තවත් එක් විනෝදාංශයක් වනුයේ දූපතේ ගැවසෙන පරෙවියන් පලවාහැරීමට මහ හඬින් ඝෝෂා කිරීමයි. මේ නිසා දැනටමත් පරෙවි දූපතේ විශාල කඳුගැටයෙන් පරෙවියන් ඉවත් වෙමින් සිටින අතර ප්‍රධාන දූපතට ඔබ්බෙන් ඇති කුඩා ගල්පර මතට ඒකරාශිවීමද සිදුවේ. මේ නිසා ආසන්නයේ සිට මෙම දුර්ලභ පක්ෂි විශේෂය නැරඹීමේ අවස්ථාව නුදුරු කාලයේදී අපෙන් ගිලිහෙනු ඇත.

බොහෝ සංචාරකයන් මෙම දූපතට මත්පැන් රැගෙන පැමිණෙන අතර, බමන මතින් දූපත අසල මුහුදට බසින ඔවුන් ගෙන ආ බෝතල් ආදිය බිඳ දමමින් ප්‍රීති වන්නේ බෝපත් ඇල්ලට උරුම කල ඉරණමම දූපතටද ලබාකරමිනි.

දූපත ආශ්‍රිත කොරල් පරයෙන් විසිතුරු මසුන් සහ බෙල්ලන් විශේෂ එකතු කිරීමත් සිදුවන හෙයින් එමගින් එහි ජෛව විවිධත්වයට හානිකර තත්ත්වයක් ඉදිරියේදී ඇතිවනු ඇත.

මේ සියල්ල සමගම සිදුවන ප්‍රධානතම හානිකර ක්‍රියාව වන්නේ සංචාරකයින් විසින් මෙම අගනා කොරල් පරයේ කැබලි සිහිවටන ලෙස ඉවත්කරගෙන යාමයි. කිසිදු තැකීමකින් තොරව වර්ණවත් සජීවී කොරල් කැබලි ඉවත් කරගැනීම පරිසර ලෝලී කාගේත් හද කම්පා කරන සිදුවීමකි.

වර්ණවත් භාවය නිසාම සිහිවටන ලෙස කොරල් කැබලි එකතු කරන සංචාරකයන් පරෙවි දූපතේ අද සුලභව දැකිය හැක. සිය පරිසරයෙන් ඉවත් කරගත් පසු සුළු මොහොතකට පමණක් පවතින එම වර්ණය නිසා දැනුවත්වම හෝ නොදැනුවත්කමින් සොබාදහමේ මේ අමිල දායාදය දිනෙන් දිනම විනාශය කරා ගමන් කරමින් සිටී. මෙම අභාග්‍යසම්පන්න සිදුවීම් තවදුරටත් ඉදිරියේදී සිදුවුවහොත් අනාගත පරපුරට තබා වර්තමානයටත් පරෙවි දූපතක් නැතිවනු ඇත. අද්විතීය ජෛව විවිධත්වයකට උරුම කියන කොරල් පරය වියැකී යනු ඇත. අවසානයේ පරෙවි යන්ද දූපත හැරයනු ඇත.

පරෙවි දූපත රැකගැනීමේ කාර්යයට අද්ම අපගේ දායකත්වය හිමිවිය යුතුය. මෙම සුවිශේෂීය මෙහෙවර සඳහා මේ වන විටත් අදාල ආයතන රාශියක් සිය දායකත්වය සපයමින් ක්‍රියාකිරීම සැබැවින්ම ප්‍රසංශනීය කරුණකි.

අපි ඔබට ආරාධනය කරමු. ඒ පරෙවි රජදහනට පැමිණෙන්නට, අපි ඔබට පවසන්නෙමු ඒ සුන්දරත්වය, සොඳුරු බව නෙත්පුරා සිත්පුරා විඳින්නට, එසේම වඩාත් ඕනෑකමින් අපි ඔබෙන් අයදින්නෙමු ඒ සොඳුරු පරිසරය සුරකින මෙන්.

සටහන හා ඡායාරූප

පාරිසරික හා ස්වභාවික සම්පත් අමාත්‍යාංශයේ, ජෛව විවිධත්ව ලේකම් කාර්යාලයේ ටී. එම්. අනුරුද්ධ තෙන්නකෝන් විසිනි.

විශේෂ ස්තුතිය ලෝක සංරක්ෂණ සංගමයේ (IUCN) ආචාර්ය චන්න බඹරදෙනිය මහතාට





